11274

AL/2021(2022)/54/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | | |
|---|---|---|---|
| **පෙරදිග සංගීතය I**<br>கீழைத்தேய சங்கீதம் I<br>Oriental Music I | **54 S I** | | **පැය දෙකයි**<br>*இரண்டு மணித்தியாலம்*<br>*Two hours* |

**විභාග අංකය :** ..................................

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 01 | 1 - 5 | |
| 02 | 6 - 13 | |
| 03 | 14 - 21 | |
| 04 | 22 - 30 | |
| 05 | 31 - 40 | |
| 06 | 41 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

tamilguru.lk

- අංක **1** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ** ලියන්න.

**1.** රි ග ස රි රි ස, ග ම රි ග ග රි යන ස්වර අභ්‍යාසයේ අවරෝහණ ස්වරූපය ආරම්භ වනුයේ,
(1) නි ධ ධ නි නි ස̇ යනුවෙනි. (2) නි ස̇ ධ නි නි ධ යනුවෙනි.
(3) නි ධ ස̇ නි නි ස̇ යනුවෙනි. (4) නි ධ ස̇ නි ස̇ නි යනුවෙනි.
(5) ස̇ නි ධ නි නි ස̇ යනුවෙනි. (......)

**2.** මන්ද්‍ර හා මධ්‍ය සප්තකය වැඩි වශයෙන් ඇසුරු කරන උත්තරාංගවාදී, උදය සන්ධි ප්‍රකාශ රාගයක් වන්නේ,
(1) භෛරව ය. (2) බාගේශ්‍රී ය. (3) ජයජයවන්ති ය.
(4) කාලිංගඩා ය. (5) හංසධ්වනි ය. (......)

**3.** ගාන්ධාරය හා නිෂාදය යන ස්වර, ශුද්ධ හා කෝමල යන දෙයාකාරයෙන්ම යෙදෙන නිර්දේශිත රාගය වනුයේ,
(1) තිලක්කාමෝද් ය. (2) බාගේශ්‍රී ය. (3) භෛරව ය.
(4) ආසාවරී ය. (5) ජයජයවන්ති ය. (......)

**4.** කෝමල ගාන්ධාරය අල්ප වශයෙන් හෝ **නො යෙදෙන** රාගය වනුයේ,
(1) ආසාවරී රාගයයි. (2) බාගේශ්‍රී රාගයයි. (3) දේශ් රාගයයි.
(4) තිලක්කාමෝද් රාගයයි. (5) ජයජයවන්ති රාගයයි. (......)

**5.** ඛලි ස්ථාන දෙක බැගින් යෙදෙන තාල යුගලය වන්නේ,
(1) ත්‍රිතාල් සහ චෞතාල් ය. (2) ඒක්තාල් සහ චෞතාල් ය.
(3) ධමාර් සහ ඒක්තාල් ය. (4) ජප්තාල් සහ දීප්චන්දි ය.
(5) ඒක්තාල් සහ ත්‍රිතාල් ය. (......)

[දෙවැනි පිටුව බලන්න.

**6.** සන්ධි ප්‍රකාශ රාගයක් සහ පරමේල ප්‍රවේශක රාගයක් පිළිවෙළින් ඇතුළත් රාග යුගලය තෝරන්න.

(1) භෛරව සහ කාෆි
(2) කාලිංගඩා සහ භෛරව
(3) දේශ් සහ තිලක්කාමෝද්
(4) කාලිංගඩා සහ ජයජයවන්ති
(5) ජයජයවන්ති සහ භෛරව (......)

● අංක **07** සිට **09** දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු අදාළ වේ.

තාල කිහිපයක් සංසන්දනය කිරීමේදී පහත සඳහන් ලක්ෂණ නිරීක්ෂණය විය.

A – තාල ස්ථාන, විභාග සංඛ්‍යාව සහ ඨේකාවේ මාත්‍රා එකතුව සමාන වේ.
B – විභාගවලට හිමි මාත්‍රා සංඛ්‍යාව සමාන වේ.
C – විභාගවලට හිමි මාත්‍රා සංඛ්‍යාව අසමාන වේ.
D – ඨේකාවේ මාත්‍රා එකතුව අසමාන වේ.
E – තාල ස්ථාන අසමාන වේ.

**7.** A සහ B යන ලක්ෂණ ඇතුළත් තාල යුගලය වන්නේ,

(1) ත්‍රිතාලය සහ තිලවඩා ය. (2) ජප්තාලය සහ දීප්චන්දි ය.
(3) තිලවඩා සහ දීප්චන්දි ය. (4) ඒක්තාලය සහ ධමාර් ය.
(5) චෞතාලය සහ ධමාර් ය. (......)

**8.** A සහ C යන ලක්ෂණ ඇතුළත් තාල යුගලය වන්නේ,

(1) ජප්තාල් සහ දීප්චන්දි ය. (2) දීප්චන්දි සහ ධමාර් ය.
(3) ත්‍රිතාල් සහ දීප්චන්දි ය. (4) ඒක්තාල් සහ චෞතාල් ය.
(5) තිලවඩා සහ ධමාර් ය. (......)

**9.** ජප්තාලය සහ ඒක්තාලය සංසන්දනය කිරීමේදී නිරීක්ෂණය විය හැකි ලක්ෂණ මොනවාද?

(1) A B C (2) B C D (3) C D E (4) A D E (5) B D E (......)

**10.** කිසියම් ස්වරයක් එහි දෙපස ඇති ස්වර ඇසුරු කරමින් චලනය කොට ගැයීම, හඳුන්වනු ලබන පාරිභාෂික නාමය වනුයේ,

(1) මූර්කි ය. (2) ඛත් ය. (3) උපජ් ය. (4) මීන්ඩ් ය. (5) සූත් ය. (......)

**11.** උත්තර භාරතීය ප්‍රකට ශාස්ත්‍රීය ගායන ශිල්පියෙකු **නොවන්නේ,**

(1) පණ්ඩිත් ජස්රාජ් ය.
(2) උස්තාද් රෂීද් ඛාන් ය.
(3) පණ්ඩිත් බිම්සෙන් ජෝෂි ය.
(4) පණ්ඩිත් ශිවකුමාර් ෂර්මා ය.
(5) බෙගම් පර්වීන් සුල්තානා ය. (......)

**12.** ධ්‍රැපද් ගායනය හා සම්බන්ධ **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.

(1) පඛාවාජය තාල වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගැනීමයි.
(2) චෞතාල්, සූල්තාල් වැනි තාල අනුව ගායනය කිරීමයි.
(3) ගාම්භීර ප්‍රකෘති සම්පූර්ණ රාග පමණක් ගායනය කිරීමයි.
(4) නෝම් තෝම් ආලාප ගායනය කිරීමයි.
(5) රාජ සභාව ආශ්‍රිතව ගොඩනැගුණු ගායනා විශේෂයක් වීමයි. (......)

**13.** කර්ණාටක සංගීතයේ භාවිතවන ස්වර නාම සංඛ්‍යාව සහ හින්දුස්තානි සංගීතයේ භාවිතවන මේල සංඛ්‍යාව පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

(1) 10, 16 (2) 07, 10 (3) 07, 72 (4) 16, 72 (5) 16, 10 (......)

**14.** රාගධාරී සංගීතයේ ඇති සුවිශේෂී ලක්ෂණයක් වනුයේ,

(1) රාග ආශ්‍රිත ප්‍රබන්ධ ඒ ආකාරයෙන්ම ගායනය, වාදනය කරන අතර, සුදුසු පරිදි කෝඩ්ස් (chords) යොදා ගැනීමයි.
(2) ආරම්භයේ සිට අවසානය දක්වා එකම ලයක් භාවිත කිරීමයි.
(3) ස්වර සංවාද (Harmony) සහිතව නිර්මාණාත්මකව ගායනයෙහි වාදනයෙහි යෙදීමයි.
(4) රාග නියමයන්ට අනුකූලව නිර්මාණාත්මකව ගායනයෙහි වාදනයෙහි යෙදීමයි.
(5) රාග ආශ්‍රිත ප්‍රබන්ධ සටහන් කර ඇති ආකාරයටම ප්‍රතිනිර්මාණය කිරීමයි. (......)

**15.** තබ්ලාවේ වාදනය වන කායදා, රේලා ආදී පද තුළ කෙරෙන විස්තාරයන් හඳුන්වනු ලබන්නේ,

(1) තිහායි යනුවෙනි. (2) චක්‍රදාර් යනුවෙනි. (3) මුඛඩා යනුවෙනි.
(4) පරන් යනුවෙනි. (5) පල්ටා යනුවෙනි. (......)

**16.** රාගාශ්‍රිත පදනමක් සහිත ගීත රසාස්වාදය සඳහා වඩාත් උපකාරී වන සාධකය කුමක් ද?

(1) සංගීත නිර්මාණ ශිල්පියා පිළිබඳ තොරතුරු
(2) පද මාලාව පිළිබඳ දැනුම සහ තාලාවබෝධය
(3) යොදාගෙන ඇති අවනද්ධ භාණ්ඩ පිළිබඳ දැනුම
(4) වාදක මණ්ඩලය පිළිබඳ තොරතුරු සහ ගීත රචනයට පාදක වී ඇති සංසිද්ධීන්
(5) තනු නිර්මාණය සඳහා පාදක වී ඇති ස්වර තාල හා ගී පද මාලාව පිළිබඳ අවබෝධය (......)

**17.** "නංගීට බැඳපු මල් වියනයි" මෙම සරල ගීතය නිර්මාණයට පදනම් වූ ගීත විශේෂය කුමක් ද?

(1) කපිරිඤ්ඤා ගීත (2) ග්‍රැමෆෝන් ගීත (3) චිත්‍රපට ගීත
(4) වැදි ගීත (5) කණ්ඩායම් ගීත (......)

**18.** "ලකල පරසිඳු කතරගම පුර කදිර සුරිඳුගෙ පාද නමදිමු" මෙම ගී පාදය ජාති ලක්ෂණය අනුව බෙදා ඇත්තේ කෙසේ ද?

(1) | $\hat{1}$ 2 | $\hat{1}$ 2 | $\acute{1}$ 2 3
(2) | $\hat{1}$ 2 | $\hat{1}$ 2 3 | $\acute{1}$ 2 3 4
(3) | $\hat{1}$ 2 | $\hat{1}$ 2 | $\acute{1}$ 2 3 4
(4) | $\hat{1}$ 2 3 | $\acute{1}$ 2 3 4
(5) | $\hat{1}$ 2 | $\acute{1}$ 2 3 4 (......)

**19.** වේද ගීතිකා ගැයෙන ආකාරය විස්තර වී ඇත්තේ,

(1) ඍග් වේදයේ ය. (2) යජුර් වේදයේ ය. (3) සාම වේදයේ ය.
(4) අථර්වන් වේදයේ ය. (5) උපනිෂද් වේදයේ ය. (......)

**20.** ශ්‍රී ලාංකේය චිත්‍රපට සංගීතය සඳහා මුල් යුගයේ දී දායක වූ ඉන්දීය සංගීත අධ්‍යක්ෂවරුන් සහ ගායක ගායිකාවන් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ටී.ආර්. පාපා, ජමුනා රාණි, මොහොමඩ් ගවුස්, ජී.එස්.බී. රාණි
(2) මොහොමඩ් ගවුස්, ඒ.එම්. රාජා, ආර්. නාරායන්, රුක්මණී දේවි
(3) එස්.එස්. වේදා, සරෝජා, එස්. දක්ෂිණ මූර්ති, කේ. රාණි
(4) ජමුනා රාණි, ටී.ආර්. පාපා, ජී.එස්.බී. රාණි, මොහොමඩ් ගවුස්
(5) ආර්. මුත්තුසාමි, ජී.එස්.බී. රාණි, මොහොමඩ් ගවුස්, මොහිදීන් බෙග් (......)

**21.** සොකරි, කෝලම්, නාඩගම් සහ නූර්ති යන රංග ශෛලීන්වලට තාල වාදනය සඳහා යොදාගනු ලැබූ අවනද්ධ භාණ්ඩ අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) ගැටබෙරය, තබ්ලාව, පහතරට බෙරය සහ මද්දලය
(2) ගැටබෙරය, පහතරට බෙරය, මද්දලය සහ තබ්ලාව
(3) පහතරට බෙරය, ගැටබෙරය, මද්දලය සහ තබ්ලාව
(4) තබ්ලාව, මද්දලය, ගැටබෙරය සහ පහතරට බෙරය
(5) මද්දලය, පහතරට බෙරය, ගැටබෙරය සහ තබ්ලාව (......)

**22.** පූර්ව රංගය සහ අපර රංගය යනුවෙන් රංග අවස්ථා දෙකක් යොදාගෙන ඇති දේශීය රංග සම්ප්‍රදාය හා ඊට අදාළ චරිතය කුමක් ද?

(1) කෝලම් – මුදලි
(2) නාඩගම් – ජසයා
(3) නූර්ති – බහුබූතයා
(4) කෝලම් – සෙල්ලම් ළමා
(5) නාඩගම් – සූත්‍රධාරී (……)

**23.** වයලීන පවුලට අයත් සංගීත භාණ්ඩ අතුරින් Tenor, Alto සහ Soprano යන හඬතල තුනටම අදාළ ස්වර පරාසයන් වාදනය කල හැකි සංගීත භාණ්ඩය කුමක් ද?

(1) Cello (2) Violin (3) Viola
(4) Double Base (5) Violin cello (……)

- අංක **24** සිට **25** ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත සඳහන් ස්වර ප්‍රස්තාරය උපයෝගී කරගන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 සරිගු | රිගුරි | 2 සරිගු | රිගුරි | 3 සරිගු | රිගුස | 4 රි – – | – – – |
| 5 රිගුම | ගුමගු | 6 රිගුම | ගුමගු | 7 රිගුම | ගුරිගු | 8 ස – – | – – – |

**24.** ඉහත ප්‍රස්තාරයේ ස්වර වෙනුවට "⁒" සංකේතය භාවිත කිරීමට හැකි විභාග දැක්වෙන වරණය තෝරන්න.

(1) 1, 5 (2) 2, 3 (3) 2, 6 (4) 3, 7 (5) 6, 7 (……)

**25.** මූලික ශ්‍රැති ස්වරය (tonic note) බටහිර 'C' ස්වරයට සමාන සේ සැලකූ විට ඉහත ස්වර ප්‍රස්තාරය අයත් ස්කේලය

(1) $E^b$ වේ. (2) $C^m$ වේ. (3) $B^b$ වේ. (4) C වේ. (5) $D^m$ වේ. (……)

**26.** හඬ පටිගත කිරීමකදී ව්‍යවහාරික සංගීත භාණ්ඩයක් වෙනුවට භාවිත කළ හැකි පරිගණක මෙවලම කුමක් ද?

(1) MIDI Keyboard (2) VHS Tape (3) CD/DVD
(4) MIDI Cable (5) VST Instrument (……)

**27.** C, E, G, B යන ස්වර ඇතුළත් කෝඩ් (chord) එක වනුයේ,

(1) C major (2) $C7^{th}$ (3) $C^{minor7th}$ (4) $C^{major\ 7th}$ (5) $C^{Augmented}$ (……)

**28.** ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය සඳහා ආභාසය ලැබී ඇතැයි සැලකෙන විදේශීය සංගීතය වන්නේ,

(1) ස්පාඤ්ඤ සංගීතයයි.
(2) අප්‍රිකානු සංගීතයයි.
(3) පෘතුගීසි සංගීතයයි.
(4) චීන සංගීතයයි.
(5) ගැමිලැන් සංගීතයයි. (……)

**29.** Woodwind Single Reed Instrument ගණයට අයත්, සංගීත භාණ්ඩය වන්නේ,

(1) පිකලෝ ය. (2) ටියුබා ය. (3) ඕබෝ ය.
(4) සැක්සෆෝන් ය. (5) බැසූන් ය. (……)

**30.** 'ඔසිලස්කෝප්' නම් උපකරණය භාවිත කරනු ලබන්නේ,

(1) සංගීත භාණ්ඩ නිවැරදිව සුසර කර ගැනීම සඳහා ය.
(2) ධ්වනි තරංග ගමන් ගන්නා වේගය මැන ගැනීම සඳහා ය.
(3) ශබ්ද තරංග පටිගත කිරීම සඳහා ය.
(4) පටිගත කරන ලද නාදයක් ප්‍රතිනිෂ්පාදනය කර ගැනීම සඳහා ය.
(5) නාද තරංගවල රටා සහ හැඩ විශ්ලේෂණය කිරීම සඳහා ය. (……)

[පස්වැනි පිටුව බලන්න.

● අංක **31** සිට **50** තෙක් ඇති ප්‍රශ්නවල ඇති හිස් තැන් සඳහා සුදුසුම පිළිතුරු යොදන්න.

**31.** සංගීත ස්වරයන්ගේ ප්‍රභවය උදාත්ත, ........................................ හා ස්වරිත වශයෙන් දක්වනු ලබන අතර, වෛදික ගීත ගායනා කරන ලද නාද ස්ථාන හතර පිළිවෙළින් ආර්චික, ගාථික, ................................ හා ස්වරාන්තරිත වශයෙන් දැක්වේ.

● පහත සඳහන් රාගාශ්‍රිත ස්වර ඛණ්ඩ ඇසුරෙන් අංක **32** සිට **36** තෙක් ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – පනිස්නිප, ගපරි, නිප, ස

B – මපධුස්, ස්නිධුප, මපගු, රිස

C – නිධ, පධමගරි, ගනිස

D – මගුමගුස, නිසධුනි, සම

E – සම, ගුමධ, නිධ, මගුරිස

More Past Papers at
tamilguru.lk

**32.** 'A' හි දැක්වෙන ස්වර අයත් වන්නේ ................................ ථාටයට අයත් වන ................................ රාගයට ය.

**33.** 'B' හා 'C' වලින් දැක්වෙන ස්වර ඛණ්ඩ අයත් වන රාග අතුරෙන් සම්පූර්ණ ජාති රාගය ................................ වන අතර, ඖඩව සම්පූර්ණ ජාති රාගය ........................................ වේ.

**34.** ඉහත 'D' හි ඇතුළත් රාගයේ නම ................................ වන අතර, ඊට අදාළ නිර්දේශිත රාගාශ්‍රිත ගීතයක් ලෙස ................................ ගීතය හැඳින්විය හැක.

**35.** ඉහත 'D' සහ 'E' හි ඇතුළත් රාගයන්හි වාදී, සංවාදී ස්වරයන් පිළිවෙළින් ................................ හා ................................ වේ.

**36.** ඉහත දක්වා ඇති රාග අතුරෙන් කර්ණාටක සංගීත පද්ධතියට ආවේණික රාගයේ නම ................................ වන අතර, එම සංගීත පද්ධතියේ මේල සංඛ්‍යාව ................................ කි.

**37.** ගු, ධු, නි යන ස්වර කෝමලව යෙදෙන නිර්දේශිත උත්තරාංගවාදී ඖඩව-සම්පූර්ණ රාගය ................................ වන අතර, ඊට සමප්‍රකෘති වන රාගයේ ජාතිය ........................................ වේ.

**38.** හින්දුස්තානි රාගධාරී ගායනයේදී ගී පද භාවිතයෙන් ගැයෙන ආලාපය ................................ නමින් හැඳින්වෙන අතර, සිතාර් වාදනයක රිද්මයානුකූල ආලාපය ................................ ලෙස හැඳින්වේ.

**39.** ගීතයක හෝ වාදිතයක ආරම්භයේ සිට සමස්ථානයට ප්‍රවිෂ්ට වන තෙක් ගැයෙන / වැයෙන කොටස ........................................ නමින් හැඳින්වෙන අතර, ස්වර කොටසක් තෙවරක් ගායනය/වාදනය කර සමස්ථානයට පැමිණීම ........................................ නමින් හැඳින්වේ.

**40.** $FA^{b}C$ යන ස්වර ........................................ කෝඩ් (chord) එක නියෝජනය කරන අතර, $E^{b}GB^{b}$ යෙදෙන කෝඩ් (chord) එක ........................................ නමින් හැඳින්වේ.

[ හයවැනි පිටුව බලන්න.

**41.** Number 06 පැස්ටරෝල් සිම්ෆනිය සංගීතඥ ......................................... ගේ නිර්මාණයක් වන අතර, ජුපිටර් සිම්ෆනිය සංගීතඥ ......................................... ගේ නිර්මාණයකි.

**42.** දේශීය සුෂිර වාද්‍ය භාණ්ඩයක් වන ................................ හා සමාන අපරදිග ඩබල් රීඩ් ගණයට අයත් සංගීත භාණ්ඩය හැඳින්වෙනුයේ ................................ යන නමිනි.

**43.** කර්ණාටක සංගීතයේ ආභාසයෙන් උඩරට .................... නිර්මාණයේ දී ................................ නමැති සංගීතඥයා එයට පුරෝගාමී වී ඇත.

**44.** කෝලම් රංග ශෛලියට ම ආවේණික වූ තාල හා සුෂිර වාද්‍ය භාණ්ඩ යුගලය පිළිවෙළින් ........................ හා ................................ වේ.

**45.** | $\hat{1}$ 2 | $\hat{1}$ 2 | $\hat{1}$ 2 | $\acute{1}$ 2 3 4 | $\acute{1}$ 2 3 4 යන තිත ......................................... වශයෙන් හැඳින්වෙන අතර, එය උඩරට නර්තනයේ දී ......................................... ගායනය සඳහා විශේෂිත වූවකි.

**46.** බඹරුඇවිත් චිත්‍රපටයේ 'උදුම්බරා හිනැහෙනවා' ගීතය ......................................... ශිල්පියා විසින් ගායනා කර ඇති අතර, එම චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය කර ඇත්තේ ......................................... සූරීන් විසිනි.

**47.** 'හිතක පිපුණු මල්' චිත්‍රපටයේ ......................................... ගීතය තුළ හින්දුස්තානි රාගධාරී සංගීත ආභාසය පිළිබිඹු වන අතර, එය ගායනා කරන ලද්දේ ......................................... මහතා විසිනි.

**48.** Interlude යනු සරල ගීතයක යෙදෙන ......................................... වන අතර, ගී පාද දෙකක් අතර සම්බන්ධතාවය ගොඩනැගීම සඳහා භාවිත කරන කෙටි ස්වර ඛණ්ඩය ......................................... නමින් හැඳින්වේ.

**49.** ෂඩ්ජයේ කම්පන වාර සංඛ්‍යාතය හර්ට්ස් 240 නම් මධ්‍යමයේ සහ පංචමයේ කම්පන වාර සංඛ්‍යාතයන් පිළිවෙළින් හර්ට්ස් ........... හා ........... වේ.

**50.** ගායන ශිල්පී ගුලාම් අලි ......................................... ගායන ශෛලිය සඳහා සුප්‍රසිද්ධ වූ අතර, පණ්ඩිත් අනින්දෝ චැටර්ජි ......................................... වාදන ශෛලිය ප්‍රගුණ කළ සංගීතඥයෙකි.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

**පෙරදිග සංගීතය II**
கீழைத்தேய சங்கீதம் II
Oriental Music II

**54 S II**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**
∗ **I** කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, **II** කොටසින් **එක්** ප්‍රශ්නයකට ද, **III** කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, වශයෙන් ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකට ම **ලකුණු 20** බැගින් ලැබේ.)

## I කොටස

**1.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග හතරකට අයත් ස්වර සංගති කිහිපයකි.

A – ස, මග̲, මධනි̲ස̇, නි̲ධ, මග̲රිස
B – ස, රිමපනිස̇, නි̲ධප, ධ, මගරි
C – ස, රිමපධ̲, මපධ̲, මපග̲, රි, ස
D – ස, නි̲̣සරි̲ග, මප, ධ̲ප, ගමග

(i) ඉහත රාග හතර හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත රාග අතුරෙන් කෝමල ධෛවතය සහ කෝමල ගාන්ධාරය වාදී සහ සංවාදී වන රාගයකට අදාළ මධ්‍යලය ගීතයේ හෝ වාදිතයේ, ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර, මාත්‍රා 16ක තානාලංකාර **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 08 යි.)

(iii) ඉහත රාග අතුරෙන් බිලාවල් මේලයට අයත් සම්පූර්ණ ජාති රාගයට අදාළ පල්ටාවක් (රාග ආශ්‍රිත ස්වර අභ්‍යාසයක්) උච්ච ෂඩ්ජය දක්වා ගොඩනගන්න. (ලකුණු 04 යි.)

(iv) ඉහත දී ඇති '**D**' හි දැක්වෙන රාගයට අයත් සමප්‍රකෘති රාගය නම් කර, එම රාග දෙකෙහි සමානතා **දෙකක්** හා අසමානතා **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි.)

**2.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග කිහිපයකට අයත් මුඛ්‍යාංග කිහිපයකි.

A – රිග̲රිස, නි̲̣ධ̣ප̣, රි
B – ගමධ̲ධ̲ප, මගමරි̲ස
C – ගපනිප, ගරි, රිගපරිස
D – මප, නි̲ධ̲ප, මපග̲, රිමප

(i) ඉහත මුඛ්‍යාංගයන්ට අදාළ වන රාග නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත රාග අතුරෙන් උත්තරාංග වාදී සම්පූර්ණ ජාති රාගයකට අදාළ මධ්‍යලය ගීතයේ හෝ වාදිතයේ අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කර, මාත්‍රා 16කින් යුත් තානාලංකාර **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 08 යි.)

(iii) ත්‍රිතාලයට ගැළපෙන පරිදි මාත්‍රා 16කින් යුත්, කායදාවක් සහ මාත්‍රා 16කින් යුත් තිහායි පදයක් ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 08 යි.)

[දෙවැනි පිටුව බලන්න.

**3.** (i) මධ්‍යලයෙන් ආරම්භ වන ශාස්ත්‍රීය වාදනයක පහත සඳහන් අංග යෙදෙන අයුරු අනුක්‍රමිකව ලියා දක්වන්න.

- ස්ථායි මධ්‍යාලාප
- පූර්වාලාප
- වාදිතයේ අන්තරා කොටස
- චක්‍රදාර් (චක්‍රදාර් තිහායි)
- ඣාලා
- වාදිතයේ ස්ථායි කොටස
- තානාලංකාර
- අන්තරා මධ්‍යාලාප (ලකුණු 04 යි.)

(ii) හංසධ්වනි රාගයට අදාළව මාත්‍රා 16කට නොඅඩු තානාලංකාරයක් තිහායි කොටසක් සමග තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(iii) ඔබ කැමති නිර්දේශිත රාගයකට අයත් විලම්බලය වාදිතයක මුඛඩාව සහ මාත්‍රා 08කට නොඅඩු තානාලංකාරයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

## II කොටස

**4.** (i) නෙළුම් ඔස ගායනා තුළ අන්තර්ගත වන සංගීතමය ලක්ෂණ **හතරක්** ලියා දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) උඩරට ශාන්තිකර්ම ගී හා සබරගමු ශාන්තිකර්ම ගී පිළිබඳ කරුණු **හතරක්** ඇසුරෙන් සංසන්දනය කර දක්වන්න. (ලකුණු 04 යි.)

(iii) ආසාතාත්මක වැලපුම් ගීයක පාද දෙකක්, ගීත ස්වර ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04 යි.)

(iv) 'ජීවන වෘත්තියක් ලෙස පතල් රැකියාවේ යෙදුණු ගැමියා එම කාර්යයට අනුව ඔවුන් ලැබූ දුක් පීඩා හා චිත්ත පීඩා ප්‍රකාශ වන පරිදි ගී ගායනා කර ඇත'. මෙම කියමන නිදසුන් ඉදිරිපත් කරමින් සනාථ කරන්න. (ලකුණු 08 යි.)

**5.** (i) නූර්ති හා නාඩගම් රංග ශෛලීන්හි සංගීතමය ලක්ෂණ කරුණු **හයක්** ඇසුරෙන් සංසන්දනය කර දක්වන්න. (ලකුණු 06 යි.)

(ii) හින්දුස්තානි ධ්‍රැපද් හා ඛ්‍යාල් ගායන ශෛලීන්ගේ ආභාසය ලබා ඇති නූර්ති ගීත **දෙකක්** නම් කර, ඉන් **එක්** ගීතයක මුල් කොටස පමණක් පද ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(iii) පහත දක්වා ඇති ශීර්ෂ ඔස්සේ කෝලම් රංග ශෛලිය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

- රංගගත කළ ස්ථානය
- ගී තනුවල ස්වභාවය
- යොදාගත් සංගීත භාණ්ඩ
- රංග ශෛලිය ඇසුරින් නිර්මාණය වී ඇති සරල ගීත (ලකුණු 08 යි.)

## III කොටස

**6.** A හා B ලෙස අපරදිග සංගීත ප්‍රස්තාර කොටස් දෙකක් පහත දැක්වේ.

**A ප්‍රස්තාරය**




**B ප්‍රස්තාරය**



(i) මූලික ශ්‍රැති ස්වරය (tonic note) අපරදිග 'C' ස්වරයට සමාන සේ සලකා, ඉහත A කොටසින් දක්වා ඇති අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(ii) ඉහත A ප්‍රස්තාරය වාදනය කිරීමේදී, එහි සඳහන් අපරදිග සංගීත ප්‍රස්තාරකරණයට විශේෂිත වූ සංකේත දෙක නම් කර, ඊට අනුකූලව එම ප්‍රස්තාරය වාදනය කළ යුතු ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) ඉහත A සහ B ස්වර ප්‍රස්තාර අයත් ස්කේල් (scale) නම් කරන්න. (ලකුණු 02 යි.)

(iv) ඉහත B ස්වර ප්‍රස්තාරයට ගැළපෙන කෝඩ්ස් (chords), අනුපිළිවෙළින් ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04 යි.)

**7.** (i) පහත වගුවෙහි (i) සිට (x) දක්වා එක් එක් හිස්තැනට අදාළ පිළිතුරු අදාළ අංකය සමග ලියා දක්වන්න.

| සංගීත අධ්‍යක්ෂවරයා | චිත්‍රපටය | ගීතය |
|---|---|---|
| මොහොමඩ් ගවුස් | (i) ........................................ | ප්‍රීති ප්‍රීති සන්ධ්‍යා කාලේ |
| (ii) ........................................ | මාතලන් | සිරිනි සරුසර වීලා |
| ආනන්ද සමරකෝන් | (iii) ........................................ | මනරංජන දර්ශනීය ලංකා |
| (iv) ........................................ | කඩවුණු පොරොන්දුව | සන්ධ්‍යාවේ ශ්‍රිය රම්‍යා ලෙස |
| බී.එස්. පෙරේරා | (v) ........................................ | වෙසක් කැකුළු අතු අග හිඳ |
| (vi) ........................................ | කැළෑ හඳ | (vii) ........................................ |
| සෝමදාස ඇල්විටිගල | (viii) ........................................ | සිනිඳු සුදු මුතු |
| (ix) ........................................ | රන්මුතු දූව | (x) ........................................ |

(ලකුණු 10 යි.)

(ii) 1967 න් පසු සිංහල චිත්‍රපටවල ඇති වූ නව ප්‍රවණතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

(iii) මෙරට චිත්‍රපට සංගීතයේ වර්ධනීය අවස්ථා මතු කරමින්, 'රේඛාව' සහ 'සත්සමුදුර' යන චිත්‍රපටවල සංගීතය පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 08 යි.)

[හතරවැනි පිටුව බලන්න.

**8.** පහත සඳහන් (අ), (ආ) සහ (ඉ) යන කොටස් අතුරෙන් **දෙකක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.

(අ) සංගීත විශාරද වින්සන්ට් සෝමපාල සූරීන් විසින් පාසල් සංගීත අධ්‍යාපනය උදෙසා සිදු කරන ලද මෙහෙවර පිළිබඳ පහත සඳහන් මාතෘකා අනුව විමසුමක් කරන්න.

- ගීත ප්‍රබන්ධයන්හි භාෂාව
- ග්‍රන්ථ සම්පාදනය
- රාග හා තාල
- සංගීත අධ්‍යාපනයට එක්කළ ගීත

(ආ) භාරතීය සංගීතයේ ප්‍රභවය හා විකාශය සඳහා ගෝත්‍රික ගීත බලපෑ ආකාරය පැහැදිලි කර දක්වන්න.

(ඉ) සරල ගීතවල අන්තර්ගත Adlib, Counter Point යන කොටස් ගීත ප්‍රස්තාර ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු $10 \times 2 = 20$ යි.)

***

More Past Papers at
tamilguru.lk